# ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

## 01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
යොමු අංකය : E/2/24 (ix) දිනය : 2007.12.14

1.2 අමාත්‍යාංශය : අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
යොමු අංකය : MIA/01/06/01/4 දිනය : 2007.01.25

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/C/06/01/04 දිනය : 2011.06.23

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST – 2 / RECRU/05/3603 දිනය : 2009.11.19
2011.05.08
2012.10.19

1.5 ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NSCC/4/1/4/SR1 දිනය : 2012.09.24

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය : PSC/EST/7/1/1/9/2013 දිනය : 2013.12.20

## 02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ආගමන හා විගමන පාලක ජනරාල්

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී - බණ්ඩ 2

3.2 ශ්‍රේණිය : II ශ්‍රේණිය
I ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත ඇතුළු ආගමන හා විගමන කාර්යයට අදාල වන්නාවූ පනත්/ගිවිසුම් හා ඒ යටතේ පනවන ලද ව්‍යවස්ථා හා රෙගුලාසි මගින් බලයලත් නිලධාරී නිල නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ/ නියාමනය කිරීමේ/ විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නාවූ කාර්ය භාරයක් සහිත තනතුරකි.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

## 04. තනතුරේ ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

5.1 සේවා ගණයට අදාල වැටුප් කේත අංකය : MN 5 – 2006 (A)

5.2 අදාල මාසික වැටුප් පරිමාණය : 16720 – 10x320 – 11x365 – 15x450 – 30685

5.3 අදාල මාසික වැටුප් පියවර :

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහකාර
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී ...
බත්තරමුල්ල.

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප රු. |
|---|---|---|
| II | 1 පියවර | 16720/- |
| I | 12 පියවර | 20285/- |

## 6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| බලයලත් නිලධාරී | II/I | 358 | ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්තොටුපල හා ජාත්‍යන්තර වරාය මඟින් දිවයිනට ඇතුළු වන හා පිට වන ස්වදේශිකයින්ගේ හා විදේශිකයින්ගේ ගමන් බලපත් හා වීසා පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධ අනෙකුත් රාජකාරි සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධාරී සංඛ්‍යාව : ඒකාබද්ධ නිලධාරී සංඛ්‍යාව 358

6.2.1 පිරිමි/කාන්තා ප්‍රතිශතය පිරිමි : 90%
කාන්තා: 10%

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II ශ්‍රේණිය හා I ශ්‍රේණිය ඒකාබද්ධ නිලධාරී සංඛ්‍යාව සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

බඳවා ගැනීම විවෘත පදනමින් සහ සීමිත පදනමින් සිදු කරනු ලැබේ. ඒ සඳහා එම අංශ දෙක යටතේ වෙන වෙනම ලිඛිත පරීක්ෂණ පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව ඉහලම ලකුණු ලැබූවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව ලෙස සලකනු ලබන්නේ අයදුම්පත් කැඳවීම් නිවේදනයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 60% |
| සීමිත | 40% |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහකාර
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුබුතිපුර පාර,
බත්තරමුල්ල.

සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් උපාධියක් තිබීම.

සහ

2. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නැත

7.2.2.3 පළපුරුද්ද : අදාල නැත

7.2.2.4 කායික සුදුසුකම්

(අ) අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 4 (සෙ.මී.162.5) හා පපුවේ වට ප්‍රමාණය අඟල් 32 (සෙ.මී.81.25) විය යුතුය.

(ආ) අයදුම්කාරියන්ගේ උස අඩි 5 අඟල් 2 (සෙ.මී. 156) විය යුතුය.

(ඇ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරණු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 21

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත පරීක්ෂණය

| **විෂයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම | 100 | 40 |
| ඉංග්‍රීසි භාෂාව | 100 | 40 |
| පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම | 100 | 40 |

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහකාර
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

7.2.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නැත
7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ
7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ( ලකුණු ලබා දෙනු නොලැබේ )

**"ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු:**
බඳවා ගැනීම් පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම"

<u>**සටහන**</u> : ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය

පත්කරනු ලබන බලධරයා : ආගමන හා විගමන පාලක ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම් පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම් / පළපුරුද්ද

(අ) අ.පො.ස. ( සා.පෙළ) විභාගයේදී ගණිතය, ඉංග්‍රීසි හා සිංහල / දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04 කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයන් 06ක් සමත්ව තිබීම.

සහ

අ.පො.ස. ( උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයකින් හෝ ( සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ආ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN- 01/2006 A හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර දහය (10) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් / ආයතනයකින් උපාධියක් ලබා තිබීම සහ රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN-01-2006-A

"සත්‍ය පිටපතකි"

**ප්‍රධාන කළමනාකරණ සහකාර**
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර පහක (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.2 කායික සුදුසුකම්

(අ) අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 4 (සෙ.මී.162.5) හා පපුවේ වට ප්‍රමාණය අඟල් 32ක් ( සෙ.මී. 81.25) විය යුතුය. අයදුම්කාරියන්ගේ උස අඩි 05 අඟල් 02 ( සෙ.මී.156) විය යුතුය.

(ආ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ඇ) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.3 වයස : අදාල නැත.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : බඳවා ගැනීම ලිඛිත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ.

7.3.4.1 ලිඛිත විභාගය : ( උපලේඛනය III බලන්න)

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අවබෝධය හා සාමාන්‍ය දැනීම | 100 | 40% |
| ඉංග්‍රීසි | 100 | 40% |
| පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම | 100 | 40% |

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නැත

7.3.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නැත

7.3.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
( ලකුණු ලබා දෙනු නොලැබේ)

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු**

බඳවාගැනීම් පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

සටහන : ලිඛිත පරීක්ෂනයේදී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7.3.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය

පත්කරනු ලබන බලධරයා : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්

"සත්‍ය පිටපතකි"

**ප්‍රධාන කළමනාකරණ සහකාර**
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නැත

## 08. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් ස්වාභාවය ලිඛිත / වෘත්තීය / සහතික / පාඨමාලා / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03 ) ගතවීමට පෙර | ලිඛිත - ප්‍රශ්ණ පත්‍ර 03 උප ලේඛණ IV |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | 1 ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගතවීමට පෙර | ලිඛිත - ප්‍රශ්ණ පත්‍ර 02 උප ලේඛණ V |

මෙම බඳවා ගැනීම් පරිපාටියට පූර්වාසන්න බඳවා ගැනීම් පරිපාටිය යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව ඇත්නම් මෙම බඳවා ගැනීම් පරිපාටිය යටතේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් ලෙස සැලකේ.

8.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? : ආගමන හා විගමන පාලක ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

## 09. රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුන නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු අවශ්‍යතා

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහකාර
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුබූතිපුර පාර,
බත්තරමුල්ල.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.11.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

<u>**සංලක්ෂය**</u>

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩ ඉම් සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි අදාල වේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන් අර්ථ නිරූපණවලට පරිභාහිර වන්නාවූ අර්ථ නිරූපණ:

"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි:

i. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අනිවාර්යයෙන්ම ගුවන්තොටුපල හා වරාය වල රාජකාරි කළ යුතුය.

ii. මෙම පරිපාටියේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවයන් ද සියළු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

14. නියමිත දිනට සේවයේ නියුතු බලයලත් නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම උප ලේඛනයෙහි දැක්වේ.

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහකාර
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

උප ලේඛනය I

# සේවයේ නියුතු බලයලත් නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම

(මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ට පමණක් අදාල වේ.)

මෙම බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) මගින් ලබා දී ඇති MN 5-2006 (A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන බලයලත් නිලධාරීන් සියලු දෙනාම එකී දින ලබා සිටි ශ්‍රේණිය පදනම් කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ බලයලත් නිලධාරී තනතුරට ස්ථිරව පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. එසේම වැටුප් පරිවර්ථනයේදී අදාල නිලධරයා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වන වගන්තිය අනුව ඊලඟ ඉහල වැටුප් පියවර් තැබීමද නොකළ යුතුය.

I. බලයලත් නිලධාරී II ශ්‍රේණිය

(අ) බලයලත් නිලධාරී තනතුරෙහි අවුරුදු 10ට අඩු සේවා කාලයක් සහිත නිලධාරීන්

සහ

(ආ) බලයලත් නිලධාරී තනතුරෙහි අවුරුදු 10ට වැඩි කාලයක් සහිත වුවද, I ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

බලයලත් නිලධාරී II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. බලයලත් නිලධාරී I ශ්‍රේණිය

(අ) බලයලත් නිලධාරී තනතුරෙහි අවුරුදු 10ට වැඩි සේවා කාලයක් සහිත, අදාල කාලය තුළ වැටුප් වර්ධක 10ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

III. අන්තර්ග්‍රහණය හේතුකොට ගෙන නියමිත දිනදී අදාල පන්තිවල / ශ්‍රේණිවල ඒ ඒ නිලධාරීන්ට හිමිව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් සිදු නොවනු ඇත.

සකස් කළේ:
අත්සන : ..................
නම :
තනතුර :
දිනය :

ඊ.එස්. පී. එදිරිසිංහ
නියෝජ්‍ය පාලක (පාලන)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

පරීක්ෂා කළේ:
අත්සන : ..................................................
නම :
තනතුර : ඩබ්.ඒ.ඩී. කරුණාතිලක
පාලක (පාලන)
දිනය :
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
අංක 41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

අත්සන: ..................................................

( දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : එම්.එන්.රණසිංහ
තනතුර : පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
41,ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ - 10
දිනය : 2016 05 17
නිල මුද්‍රාව :

"සත්‍ය පිටපතකි"

## ලිඛිත විභාගය

01. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු අවම |
|---|---|---|---|
| I පත්‍රය | පැය 02 | 100 | 40% |
| II පත්‍රය | පැය 02 | 100 | 40% |
| III පත්‍රය | පැය 01 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකටවරක්ද යන වග: පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම<br>1 කොටස - බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයින්ගේ තර්කන ශක්තිය, ගණිතමය දක්ෂතාවයන්, අවබෝධය හා තීරණ ගැනීමේ හැකියාව මැනීම සඳහා සැකසුනු ප්‍රශ්න පත්‍රයකි. |
| 2 කොටස - සාමාන්‍ය දැනීම | මෑත භාගයේ ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජීය, දේශපාලන තොරතුරුද, ලෝක දේශපාලනය, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍ර වල දැනීම සහ නව විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳව අරමුණු කරන ලද කෙටි හා/හෝ බහුවරණ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. |
| II. ඉංග්‍රීසි භාෂාව | කියවීමෙන් අවබෝධය ප්‍රකාශනය හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| III.පරිගණක පිළිබඳ මූලික දැනීම | පරිගණකය පිළිබඳ මූලික දැනීම MS Word, MS Excel, Internet, e - mail |

සකස් කළේ :
අත්සන :
නම :
තනතුර :
දිනය : 16/06/24

පරීක්ෂා කළේ :
අත්සන :
නම : ඩබ්.ජී.ඩී. කරුණාතිලක
තනතුර : පාලක (පාලන)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10
දිනය :

අත්සන :................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම :
එම්.එන්.රණසිංහ
තනතුර : පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ - 10
දිනය :
නිල මුද්‍රාව:

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහකාර
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර.
බත්තරමුල්ල.

උපලේඛණය III

## ලිඛිත විභාගය

01. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු අවම |
|---|---|---|---|
| I පත්‍රය | පැය 02 | 100 | 40% |
| II පත්‍රය | පැය 02 | 100 | 40% |
| III පත්‍රය | පැය 01 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I. අවබෝධය හා සාමාන්‍ය දැනීම<br>1 කොටස - අවබෝධය | අර්ථ විග්‍රහය සාරාංශ හා ඡේදයක් වටහා ගැනීමේ හැකියාව තීරණය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| 2 කොටස - සාමාන්‍ය දැනීම | මෑත භාගයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජීය, දේශපාලන තොරතුරුද, ලෝක දේශපාලනය විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍ර වල දැනීම සහ නව විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳව අරමුණු කරන ලද කෙටි හා / හෝ බහුවරණ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. |
| II ඉංග්‍රීසි භාෂාව | කියවීමෙන් අවබෝධය ප්‍රකාශන හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| III පරිගණක පිළිබඳ මූලික දැනීම | පරිගණකය පිළිබඳ මූලික දැනීම MS Word, MS Excel, Internet, e-mail |

සකස් කළේ :
අත්සන :
නම :
තනතුර :
දිනය : 16/04/14

පරීක්ෂා කළේ :
අත්සන :
නම : ඩබ්.ඒ.ඩී. කරුණාතිලක
තනතුර : පාලක (පාලන)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
අංක 41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.
දිනය :

අත්සන :.................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම :
තනතුර : එම්.එන්.රණසිංහ
පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
41,ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ - 10
දිනය :
නිල මුද්‍රාව:

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහකාර
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්...
"සුහුරුපාය", ශ්‍රී සුබූතිපුර...
බත්තරමුල්ල.

උප ලේඛණය IV

## පළමුවන කාර්යක්ෂමතා කඩඉම

01. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ බලයලත් නිලධාරීන් සඳහා පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු අවම |
|---|---|---|---|
| I පත්‍රය | පැය 02 | 100 | 40% |
| II පත්‍රය | පැය 02 | 100 | 40% |
| III පත්‍රය | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ආගමන හා විගමන පාලක ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1 ප්‍රශ්න පත්‍රය ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන I | 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධන, 1948 අංක 18 දරණ පුරවැසිභාවය පිළිබඳ පනත හා එහි සංශෝධන, 2008 අංක 38 දරණ චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ ( විශේෂ විධිවිධාන) පනත.<br>මෙම පනත් යටතේ පනවන ලද රෙගුලාසි. |
| 2 ප්‍රශ්න පත්‍රය ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන II | 1968 අංක 32 දරණ පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන.<br>1977 අංක 08 දරණ උදර්පන නීතිය හා එහි සංශෝධන.<br>මෙම පනත් වල පසුකාලීන සංශෝධන හා ඒ යටතේ පනවන් ලද රෙගුලාසි.<br>අපරාධ නඩු විධාන සංග්‍රහයේ Vවන කොටසේ XI, XII, XIII, XIV, XV පරිච්ඡේද |
| 3 ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහය II, IV, VII, XII, XIII, XIV, XLVII,XLVIII පරිච්ඡේද, අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති.<br>මුදල් රෙගුලාසි (මු.රෙ.2(1), 135, 136, 137, 138, 139 මු.රෙ. IV,VI පරිච්ඡේද) |

සකස් කළේ :
අත්සන :
නම :
තනතුර :
දිනය : 16/04/19

පරීක්ෂා කළේ :
අත්සන :
නම : ඩබ්.ඒ.ඩී. කරුණාතිලක
තනතුර : පාලක (පාලන)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
දිනය : අංක 41, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

අත්සන :..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : එම්.එන්.රණසිංහ
තනතුර : පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
දිනය : 41, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ - 10
නිල මුද්‍රාව:

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහ
පාලන අංශය
ආගමන හා විගමන දෙ...
"සුහුරුපාය", ශ්‍රී සුබ...
බත්තරමුල්ල.

උප ලේඛණය V

## දෙවන කාර්යක්ෂමතා කඩඉම

01. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ බලයලත් නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු අවම |
|---|---|---|---|
| I පත්‍රය | පැය 02 | 100 | 40% |
| II පත්‍රය | පැය 02 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ආගමන හා විගමන පාලක ජනරාල් විසින් හෝ ඔහු අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I ප්‍රශ්න පත්‍රය<br>සිද්ධි අධ්‍යයනය | ප්‍රත්‍යන්ත පාලන (Border Control) , මානව කුට්යනය ( Human Trafficking), මානව ජාවාරම( Human Smuggling), විෂයන්ට අදාල සිද්ධි අධ්‍යයනය |
| II ප්‍රශ්න පත්‍රය<br>ආයතන සංග්‍රහය සහ<br>මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහය V,VIII, XII,XIV, XV, XVI, XLVII, XLVIII පරිච්ඡේද<br><br>අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති.<br><br>මුදල් රෙගුලාසි ( මු.රෙ.124,125,127,128 සහ 135, මු.රෙ. V, VI, XI පරිච්ඡේද හා VII පරිච්ඡේදයේ II වන කොටස) හා මිලදී ගැනීමේ මූලධර්ම හා විධිවිධාන |

සකස් කළේ :
අත්සන :
නම :
තනතුර :
දිනය : 16/09/14

පරීක්ෂා කළේ :
අත්සන :
නම : ඩබ්.ඒ.ඩී. කරුණාතිලක
තනතුර : පාලක (පාලන)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.
දිනය :

අත්සන :...............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම : එම්.එන්.රණසිංහ
තනතුර : පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
41, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ - 10
දිනය :
නිල මුද්‍රාව:

"සත්‍ය පිටපතකි"

ප්‍රධාන කළමනාකරණ සහ
පාලන අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය", ශ්‍රී සුභූති පාර
බත්තරමුල්ල.